**ශීර්ෂය 211 - රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශය සහ වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ 3.1.2 වගුවේ ඇතුළත් ආදායම් සංකේතයට අදාළ එක් ආදායම් ගිණුමක්ද, විසර්ජන ගිණුම රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ, ආදායම් ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124 (2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටුකර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂය 211 - රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල වීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගෙන් විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත් හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

---

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.11 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත

කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 128 ප්‍රකාර ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ගණන්දීමේ නිලධාරීගේ එම විධිවිධානයට අනුගත වී නොතිබීම.** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 128(1)(අ) | රජය විසින් නියම කර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසාදීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලැකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට පරිශ්‍රමයක් දක්වා තිබීම. | 1. තිරසර සංවර්ධන අරමුණු කරා ළඟාවීමේ ප්‍රමාදයන් | 2.1.1 |
| | | 2. කළමනාකරණ දුර්වලතා | 2.6 |
| 128 (1)(ආ) | තම දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය හා ගිණුම්කරණය සඳහා සංවිධානය සාර්ථක බවට සහ අවශ්‍ය අවස්ථාවලදී රජයට ලැබිය යුතු ගාස්තු නිවැරදිව නිශ්චය කිරීමට ඒවා ක්‍රමනුකූලව ද සම්පූර්ණයෙන්මද අප්‍රමාදවද එකතු කරගැනීමට සහ ලැබෙන මුදල් ගිණුම්ගත කිරීමටද, රජය වෙනුවෙන් වගකීම්වලට බැඳීම් සඳහා බලය දීමටද ඉටුකරන ලද සේවාවන් සැපයීම්, අධීක්ෂණය හා පරීක්ෂා කිරීමට සහ එම රජයේ අරමුදලින් ඒ සඳහා අප්‍රමාදව හා නිවැරදිව ගෙවීම් කිරීමට ඉන් ප්‍රමාණවත් තරම් විධිවිධාන සලසා තිබීම. | 1. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.2 |
| | | 2. පෙළපොත් මුද්‍රණය කිරීමේ ක්‍රියාවලියේ අඩුපාඩු | 2.1.2 |
| | | 3. විගණන හා කළමනාකරණ කමිටු | 2.10 |
| | | 4. මානව සම්පත් කළමනාකරණයේ අඩුපාඩු | 2.11 |

| | | | |
|---|---|---|---|
| 128(1)(ඇ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේදී පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවලදී ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බව. | 1. ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම.<br>2. අනුකූල නොවීම් | 2.8<br>2.9 |
| 128(1)(ඉ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යාපනය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශණය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශණය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව. | වාහන ඉන්ධන දහනය පරීක්ෂා නොකිරීම. | 2.3 |
| 128(1)(ඌ) | හිඟව තිබෙන ශාස්තු යනාදිය අයකර ගැනීමට විශේෂ විධිවිධාන යොදන බවට සහ එම කාර්ය පැවරී ඇති නිලධාරීන් විසින් හිඟ මුදල් පිළිබඳව යටත් පිරිසෙන් තුන් මාසයකට වරක් හෝ අන්‍යාකාරයකින් විධානය පරිදි හෝ තමා වෙත වාර්තා කරන බව. | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ හිඟහිටි ණය ශේෂ අය කරගැනීම. | 2.7 |
| 128(2)(ඉ) | ආයතනවලින් හිඟහිටි ආදායම් පිළිබඳ තොරතුරු කැඳවා තිබුණද එම තොරතුරු සහ දෙපාර්තමේන්තුවේ තොරතුරු නොසැසඳුණි. | ආදායම් ගිණුමේ වූ අඩුපාඩු | 2.5 |

**2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**2.1 කාර්යසාධනය**

**2.1.1 සැලසුම් කිරීම**

**තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමේ ප්‍රමාදයන්**

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ "තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" අනුව තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක කරා ළඟා කර ගැනීමේ සූදානම පිළිබඳව දෙපාර්තමේන්තුව දැනුවත් වී

නොතිබුණි. ඒ අනුව තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනා ගැනිම, දර්ශක හඳුනා ගැනිම, ඒ සඳහා මානව හා භෞතික සම්පත් වෙන් කිරීම, දත්ත රැස් කිරිම යනාදී ක්‍රියාවන් සිදු කර නොතිබුණි.

ඉහත පරිදි වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්කකරා ළඟාවිය යුතු සන්ධිස්ථානයන්ද, ඉලක්ක මත ළඟාවීම මැනබැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.1.2 පාසල් පෙළ පොත් මුද්‍රණය

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබෙන පාසල් පෙළ පොත් මුද්‍රණ ඇණවුම් අඩුවීම නිසා එම තත්ත්වය යහපත් කර ගැනීමට ක්‍රමවේදයක් සකස් කර නිසි සැලැස්මක් සකස් කරන ලෙසට 2009 සැප්තැම්බර් 11 දින රැස් වූ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් දෙපාර්තමේන්තුවට දන්වා තිබුණි. එසේ වුවද, සමාලෝචිත වර්ෂය අවසාන වන තෙක් ඒ සඳහා නිසි සැලැස්මක් සකස් කර නොතිබුණි.

(ආ) 2011 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී මුද්‍රණය කිරීම පිණිස දෙපාර්තමේන්තුවට ලබා ගැනීමට හැකිව තිබූ පාසල් පෙළ පොත් ඇනවුම් 01 සිට 10 අතර පරාසයක විචලනයක් වී තිබූනද එහි වර්ධනයක් සිදු වී නොතිබුණි.

(ඇ) 2018 වර්ෂය සඳහා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවෙන් ලද ඇණවුමට අදාළ පාසල් පෙළ පොත් වර්ග 10 න් 7 ක්ම ප්‍රමාද වී මුද්‍රණය කර තිබුණි. ප්‍රමාද කාලය දින 01 සිට දින 187 දක්වා විය. මෙම පාසල් පෙළ පොත් මුද්‍රණ කාර්යය ඉටුකිරීම වෙනුවෙන් 2018 සැප්තැම්බර් 06 දින වන විට අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවෙන් රු. මිලියන 55.3 ක් ලැබී තිබූ අතර එම මුදලින් රු. මිලියන 5.4 ක් ප්‍රමාද ගාස්තු හා දඩ ගෙවීමට සිදු වී තිබුණි.

(ඈ) පාසල් පෙළ පොත් මුද්‍රණය කිරීමේ ක්‍රියාවලියේදී කුමන අංශයක්/ අංශ තුලින් ප්‍රමාදයක් සිදු වී පවතීද යන්න පිළිබඳව තොරතුරු අනාවරණය කර ගැනීමට හැකි තොරතුරු පද්ධතියක් දෙපාර්තමේන්තුව නොතිබුණි. මේ හේතුවෙන් පසුගිය වර්ෂයන්හි පාසල් පෙළපොත් මුද්‍රණ කටයුතු ප්‍රමාදවීමේ ගැටළුව නිරාකරණය කර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

## 2.1.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

-------------------------------

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එය 2018 අගෝස්තු 10 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් සැපයීම් හා සේවා ලබාගැනීම**

**2.2.1 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුව විසින් එකතු වටිනාකම රු.මිලියන 109.38 ක් වූ කඩදාසි මෙ.ටොන් 1626 ක් ආනයනය කිරීමේදී ලංසු ලේඛන අනුව ණයවර ලිපිය විවෘත කළ දින සිට දින 21 සිට දින 45 දක්වා කාලයක් තුළ තොග ලබා දීමට සැපයුම්කරු එකඟවී තිබූ නමුදු, මාස 01 සිට මාස 03 ක් දක්වා ප්‍රමාද වී කඩදාසි තොග ලැබී තිබුණි.

(ආ) ලංසු ලේඛන අනුව, එලෙස තොග සැපයීමට ප්‍රමාද වන සෑම සතියකටම ලංසුවේදී එකඟ වූ වටිනාකමින් සියයට 2 ක් සැපයුම්කරුගෙන් අයකළ යුතු වන අතර ඒ අනුව රු.මිලියන 19.24 ක් ප්‍රමාද ගාස්තු ලෙස අයකළ යුතු වුවද කිසිඳු ප්‍රමාද ගාස්තුවක් අයකර නොතිබුණි.

**2.3 වත්කම් කළමනාකරණය**

**වාහන ඉන්ධන දහනය වීම් පරීක්ෂා නොකිරීම**

2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව වාහන 13 ක ඉන්ධන දහනය වීම් පරීක්ෂා කර නොතිබුණි.

**2.4 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම.**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| 2013 | පුනරාවර්තන | 1,619.37 | 1,372.46 | 246.91 | 15 |
| | මූලධන | 166.60 | 129.21 | 37.38 | 22 |
| | **එකතුව** | **1,785.97** | **1,501.67** | **284.29** | **16** |
| 2014 | පුනරාවර්තන | 1,776.71 | 1,776.55 | 0.15 | 0 |
| | මූලධන | 141.00 | 105.71 | 36.78 | 26 |
| | **එකතුව** | **1,919.21** | **1,882.26** | **36.93** | **2** |
| 2015 | පුනරාවර්තන | 1,833.83 | 1,789.62 | 44.21 | 2 |
| | මූලධන | 173.01 | 146.43 | 26.58 | 15 |
| | **එකතුව** | **2,006.84** | **1,936.05** | **70.79** | **4** |
| 2016 | පුනරාවර්තන | 1,904.00 | 1,752.14 | 151.85 | 8 |
| | මූලධන | 98.00 | 89.68 | 8.32 | 8 |
| | **එකතුව** | **2,002.00** | **1,841.82** | **160.17** | **8** |
| 2017 | පුනරාවර්තන | 2,209.92 | 2,207.72 | 2.20 | 0 |
| | මූලධන | 120.27 | 119.91 | 0.36 | 0 |
| | **එකතුව** | **2,330.19** | **2,327.63** | **2.56** | **0** |

## 2.5 ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම

මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් 2017 වර්ෂය සඳහා ආදායම් සංකේත 02-03-02-05 සඳහා එකතුව රු.මිලියන 600 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 611.67 ක ආදායමක් රැස් කරගෙන තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමින් සියයට 102 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | 2017 දෙසැම්බර් 31 දිනට | | | රැස්කළ ආදායම් ඇස්තමේන්තු කළ ආදායමේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ඉක්මවීම | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 20-03-02-05 | 600.00 | 611.67 | 11.67 | 102 |

**20-03-02-05 දරන ආදායම් සංකේතය - රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ ලැබීම්**

විගණනයට ඉදිරිපත් කළ ආදායම් ගිණුම අනුව එකතුව රු.මිලියන 788.6 ක ආදායම් හිඟහිටව තිබුණු අතර, එම හිඟ හිටි ආදායම වර්ෂ 01 සිට වර්ෂ 28 ක් අතර කාල පරාසයකට අයත් විය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 1989 සිට 2009 දක්වා කාලපරිච්ඡේදය සඳහා හිඟහිට තිබූ රු.මිලියන 202.93 ක් වූ ශේෂයෙන් සියයට 18 ක් පමණ වූ රු.මිලියන 36.46 ක් පමණක් ප්‍රවර්තන වර්ෂයේදී අය වී තිබුණි.

(ආ) වර්ෂ 2010 සිට 2016 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාල ණය ශේෂය වූ රු.මිලියන 355.4 න් සියයට 13 ක් වූ රු.මිලියන 45 ක් පමණක් සමාලෝචිත වර්ෂයේදී අයකරගෙන තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානය වන විට දෙපාර්තමේන්තුව විසින් පෞද්ගලික ආයතනවලට සපයන ලද මුද්‍රණ කාර්යයන් වෙනුවෙන් අයවිය යුතු එකතු ණය ශේෂය රු.10,174,643 ක් විය. එම ණය ශේෂයෙන් රු.931,096 ක් වර්ෂ 13 ක සිට වර්ෂ 25 ක් දක්වා කාලයක සිට හිඟ හිටව පැවති අතර, 2014 වර්ෂයේ සිට හිඟ හිටව පැවති ණය ශේෂය රු.9,243,547ක් විය. සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එය අයවී නොතිබුණි.

## 2.6 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1997 දෙසැම්බර් 16 දිනැති හා අංක අමප/97/5232/17/35 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අනුව 1998 පෙබරවාරි 26 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණය පරිදි වාර්ෂික වාණිජ නිෂ්පාදන වටිනාකම මත පදනම්ව වාණිජ මුද්‍රණ දීමනාව ගෙවිය යුතු වුවද සමාලෝචිත වර්ෂයේ එකතුව රු.මිලියන 78.91 ක් වූ වාණිජ නිෂ්පාදන ආදායමක් නොවන ආදායම්ද වාණිජ නිෂ්පාදන ආදායම් ලෙස සලකා වාණිජ මුද්‍රණ දීමනාව ගණනය කර තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව තුළ පිරිවැය ගිණුම්කරණ ක්‍රමයක් ස්ථාපිත කිරීම, නිෂ්පාදන ඵලදායකත්වය ( Productivity) වැඩිදියුණු කිරීම සහ වාණිජ මුද්‍රණ දීමනාව ගෙවීම සඳහා හඳුනාගත් ප්‍රතිපාදනයක් සහිත ව්‍යාපෘතියක් (Project) හෝ අත්තිකාරම් ගිණුමක් ඇති කිරීම යන කටයුතු සිදුකළ යුතු බවට 1998 පෙබරවාරි 26 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර තිබූ නමුදු මේ වන තෙක් එම තීරණ ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයේ ලේකම්ගේ 2014 මාර්තු 01 දිනැති අංක එම්එම්අයි/05/06/2/13-2 දරන ලිපිය ප්‍රකාරව මසකට නිවාඩු දින රාජකාරී කිරීම වෙනුවෙන් නිවාඩු දින වැටුප් ගෙවීමටත්, එම දිනයන් සඳහා වෙනත් කිසිදු දීමනාවක් නොගෙවීමටත්, වෙනත් කිසිදු දීමනාවක් සඳහා එම දින ගණනය නොකිරීමටත් කටයුතු කරන ලෙස දක්වා තිබුණද වානිජ මුද්‍රණ දීමනාව ගෙවීමේදී නිවාඩු දින වැටුප් ලබාගත් දිනයන්හි රාජකාරි ඉටුකළ පැය ගණන ද වානිජ මුද්‍රණ දීමනා ලබා ගැනීමට උපයෝගී කරගෙන තිබුණි. ඒ අනුව නිලධාරීන් 25 කට සමාලෝචිත වර්ෂයේදී හිමිකම් නොමැති වාණිජ මුද්‍රණ දීමනා ලෙස එකතුව රු. 4,443,872 ක මුදලක් ගෙවා තිබුණි.

**2.7 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්**

---

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

---

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 21101 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම්** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 80 | 79 | 53 | 68 | 350 | 214 |

**හිඟ හිටි ණය ශේෂ අයකර නොගැනීම**

---

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර රු.9,037,515 ක් විය. මෙම සමස්ත හිඟ ණය ශේෂයෙන් සියයට 52 ක් එනම් රු.4,712,862 ක් වර්ෂ 05 කට වඩා පැරණි ශේෂයන් වූ අතර එම හිඟ හිටි ණය ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

**2.8 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

---

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | **ලේඛන වර්ගය** | **අදාළ රෙගුලාසිය** |
|---|---|---|
| (i) | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 211 (1) |
| (ii) | වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය | මුදල් රෙගුලාසි 1647 (ඉ) |

## 2.9 අනුකූල නොවීම

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති හා රීති රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහකර දැක්වේ.

| | නීති, රීති රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම් |
|---|---|---|---|
| (අ) | 1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥා පනතේ 41 හා 42 වගන්ති | (i) | දෙපාර්තමේන්තුව තුළ ගිනි අනතුරු සංඥා පද්ධතියක් ස්ථාපිත කර නොතිබීම. |
| | | (ii) | හදිසි අවස්ථාවකදී ආරක්ෂාව සංඥා මඟින් දක්වා නොතිබීම. |
| (ආ) | 2016 දෙසැම්බර් 09 දිනැති අංක 252/2016 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 09 වන ඡේදය | | විසර්ජන ගිණුමට අමතරව සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය 2018 ජුනි 30 දිනට පෙර පිළියෙල කර රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට පිටපතක් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි.පෙර වර්ෂයේදීද ඉහත සඳහන් මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කර නොතිබුණි. |

## 2.10 විගණන හා කළමනාකරණ කමිටුව

2016 ජනවාරි 28 දිනැති අංක DMA/2009(1)(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයෙන් සංශෝධිත 2009 ජුනි 09 දිනැති DMA/2009(1) දරන චක්‍රලේඛයේ 06 වන ඡේදය ප්‍රකාරව ආයතන ප්‍රධානියා ආදායම් ගණන්දීමේ නිලධාරියා වන දෙපාර්තමේන්තු සෑම මාස දෙකකට වරක් බැගින් වර්ෂයකට විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 06 ක් පැවැත්විය යුතු වුවද 2017 වර්ෂය තුළදී කමිටු රැස්වීම් 4 ක් පමණක් පවත්වා තිබුණි.

## 2.11 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටුකිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 994 ක් වැය කර තිබුණි. ඒ අනුව, ඒක පුද්ගල වියදම රු.806,164 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 37 | 17 | 20 | - |
| (ii) | තෘතියික මට්ටම | 08 | 04 | 04 | - |
| (iii) | ද්විතියික මට්ටම | 1234 | 632 | 602 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 694 | 575 | 119 | - |
| (v) | අනියම්/ කොන්ත්‍රාත් | - | 05 | - | 05 |
| | | 1,973 | 1,233 | 745 | 05 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** මුද්‍රණ ක්ෂේත්‍රය නව තාක්ෂණය සමඟ සීඝ්‍රයෙන් දියුණුවන ක්ෂේත්‍රයක් බැවින්, මුද්‍රණ දෙපාර්තමේන්තුවේ එක් එක් අංශය වෙත අනුයුක්ත කළ යුතු කාර්යය මණ්ඩලය නිසි වැඩ අධ්‍යයනයකින් කාලීනව හඳුනාගෙන නොතිබුණි.

**(ආ)** **කාර්ය මණ්ඩලය පුහුණු කිරීම**

සමාලෝචිත වර්ෂය සඳහා දෙපාර්තමේන්තුව විසින් පුහුණු සැලැස්මක් සකස් කර නොතිබුණි.